# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 160/48 — 1975 අප්‍රේල් 19 වැනි සෙනසුරාද — 1975.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (50)/75.

**මහාජන ආරක්ෂක ආඥපනත (40 වන අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1975 අප්‍රේල් මස 19 වන දින,
නුවරඑළිය,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**නියෝග**

1. මෙම නියෝග 1975 අංක 3 දරන හදිසි අවස්ථා (පෞද්ගලික අංශයේ) අතිරේක දීමනා නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මෙම නියෝගවල කාර්යයන් සඳහා කොමසාරිස්වරයා නියම බලධරයා වන්නේ ය.

(2) මෙම නියෝගවලින් නියම බලධරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලයක්, කටයුත්තක් හෝ කාර්යයක් කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත ඒ බලධරයා විසින් පැවරිය හැකි ය.

3. වෙන යම් ලිඛිත නීතියක හෝ වාචික, ලිඛිත, ප්‍රකාශිත හෝ ගම්‍යමාන යම් සේවා ගිවිසුමක කුමක් සඳහන්ව ඇත ද මෙම නියෝගවල විධිවිධාන වලංගුව බලපැවැත්විය යුතු ය ; තවද ඒ අනුව, මේ නියෝගවල විධිවිධාන හා ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම හා අතර යම් ගැටීමක් හෝ නොගැලපීමක් ඇති වූ අවස්ථාවක ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම අභිබවා මේ නියෝගවල විධිවිධාන බලපැවැත්විය යුතු ය.

4. (1) යම් කිසි කර්මාන්තයක, මාසය සඳහා සම්පූර්ණ ඉපයුම රුපියල් අට සියය නොඉක්මවන කම්කරුවකුගේ සෑම සේවායෝජකයකුම විසින් රුපියල් විසිපහකට නො අඩු වූ දීමනාවක් 1975 මාර්තු මාසය ද ඇතුළු එක් එක් මාසය වෙනුවෙන් 1975 මාර්තු මස 1 වන දින හෝ ඉන් පසු එම කම්කරුවාට ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුවද—

(අ) ඒ සේවායෝජකයා 1971 සැප්තැම්බර් මස 10 වන දින අංක 14,975 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද යම් සාමූහික ගිවිසුමකින් හෝ එවැනි යම් සාමූහික ගිවිසුමක් සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 10 (2) වන වගන්තිය යටතේ වූ නියමයකින් බැඳී ඇති සේවා යෝජකයකු වන අවස්ථාවක හෝ එවැනි යම් සාමූහික ගිවිසුමක් යටතේ ගෙවිය යුතු ප්‍රමාණවලට නොඅඩු වාසි සහගත තත්ත්වයෙන් යුත් වේතන සහ අනාවර්ත ජීවන වියදම් පාරිතෝෂිකයක් ස්වේච්ඡාවෙන් ම හෝ නො එසේව ගෙවන සේවායෝජකයකු වන අවස්ථාවක ගෙවිය යුතු දීමනාව, 1975 ජනවාරි මාසය සඳහා ඒ කම්කරුවාගේ මාසික වේතනයෙන් සියයට දහයක් නැතහොත් රුපියල් විසිපහක්, යන මේ මුදල් ප්‍රමාණ දෙකෙන් අඩු මුදල් ප්‍රමාණය විය යුතු ය ; තවද

(ආ) ඒ සේවායෝජකයා තේ වැවීමේ සහ සැදීමේ කර්මාන්තයේ හෝ රබර් වැවීමේ සහ සැදීමේ කර්මාන්තයේ හෝ කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ සැදීමේ කර්මාන්තයේ හෝ පොල් වැවීමේ කර්මාන්තයේ හෝ කුරුඳු කර්මාන්තයේ හෝ දුම්කොළ කර්මාන්තයේ සේවායෝජකයකු වන අවස්ථාවක ගෙවිය යුතු දීමනාව, 1975 ජනවාරි මාසය සඳහා කම්කරුවාගේ අවම දෛනික වේතනය අනුව, මාසය තුළ වැඩ කරන ලද දින ගණන සඳහා වේතන වශයෙන් ඒ කම්කරුවාට ගෙවිය යුතු මුදල් ප්‍රමාණයෙන් සියයට දහයක්, නැතහොත් රුපියල් විසිපහක්, යන මේ මුදල් ප්‍රමාණ දෙකෙන් අඩු මුදල් ප්‍රමාණය විය යුතු ය.

(2) කම්කරුවකු කැලි ප්‍රමාණයේ වැඩක හෝ දෛනික ප්‍රමාණයේ වැඩක සේවයේ යොදවනු ලැබ ඇති අවස්ථාවක, මේ නියෝග යටතේ ඔහුට ගෙවිය යුතු දීමනාව, 1975 ජනවාරි මාසයේ වේතන ප්‍රමාණය මත පදනම් වූ අවස්ථාවෝචිත පරිදි කැලි ප්‍රමාණය හෝ දෛනික ප්‍රමාණය අනුව ඔහුට ගෙවිය යුතු වේතනයෙන් සියයට දහයකට අඩු නොවන මුදලක් විය යුතු ය :

එසේ වුව ද මේ නියෝග යටතේ ගෙවනු ලැබිය යුතු මුදල මසකට රුපියල් විසිපහක් නොඉක්මවිය යුතු ය.

125A— ඒ 13673—5,150 (75/04)

(3) මාසික පරිමානයක් මත සේවයේ යොදවනු ලැබ සිටින කම්කරුවකු, ඔහුට සේවායෝජකයා විසින් වැඩ දීම නොකර හැරීම නොවන යම් හේතුවක් නිසා, යම් ලිඛිත නීතියකින් නැතහොත් ගිවිසුමකින් නියමිත පරිදි වූ අවශ්‍ය දින ගණන, වැඩ නොකරන අවස්ථාවක, ඒ කම්කරුවාට ගෙවිය යුතු දීමනාව ඔහු වැඩ කර ඇති දින ගණනට ප්‍රමාණානුකූල විය යුතු ය.

(4) මාසය සඳහා සම්පූර්ණ ඉපයුම, රුපියල් අට සියය ඉක්මවන නමුත් රුපියල් අටසිය හැත්තෑපහට අඩු කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම, රුපියල් අටසිය හැත්තෑපහ සහ එම කම්කරුවා විසින් ඒ මාසය සඳහා ලබන වැටුප හෝ වේතනය අතර ඇති වෙනසට සමාන මුදලක්, 1975 මාර්තු මාසය ද ඇතුලු එක් එක් මාසය වෙනුවෙන් එම කම්කරුවාට දීමනාව ලෙස ගෙවනු ලැබිය යුතු ය.

5. මේ නියෝගවල ඉහත සඳහන් විධිවිධානයන්හි කුමක් සඳහන්ව ඇත ද එම විධිවිධානවල සඳහන් දීමනාව—

(අ) 1967 අංක 5 දරන සාමූහික ගිවිසුම අදාළ වන කම්කරුවකුට ;

(ආ) (අ) ඡෙදයෙහි සඳහන් සාමූහික ගිවිසුම යටතේ ගෙවිය යුතු මුදලට නොඅඩු වාසි සහගත තත්ත්වයෙන් යුත් වේතන සහ අනාවර්ථ ජීවන වියදම් පාරිතෝෂිකයක් සේවායෝජකයා විසින් ස්වේච්ඡාවෙන්ම හෝ නොඑසේව ගෙවනු ලබන කම්කරුවකුට ;

(ඇ) කොළඹ පාරිභෝගිකයන්ගේ දර්ශකය අනුව තීරණය කරන ලද ජීවන වියදම් දීමනාවක් සේවායෝජකයා විසින් ගෙවනු ලබන කම්කරුවකුට ;

(ඈ) 1969 අංක 6 දරන පනතින් සංශෝධිත 1963 අංක 4 දරන දේශීය ආදයම් පනතේ 16අ වන වගන්තිය යටතේ අනුමත පුණ්‍යායතනයක් ලෙස ප්‍රකාශිත ආයතනයක සේවයේ යොදවනු ලැබ සිටින කම්කරුවකුට ;

(ඉ) යම් කම්කරුවකුගේ සේවායෝජකයෙක්, 1971 සැප්තැම්බර් මස 10 වන දින අංක 14,975 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද සාමූහික ගිවිසුම සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 10 (2) වන වගන්තිය යටතේ කරන ලද නියමයකින් බැඳී සිටී ද, ඒ ගිවිසුම් අනුව වේතන සහ අනාවර්ථ ජීවන වියදම් පාරිතෝෂිකයක් ගෙවයි ද, එසේම ඒ සේවායෝජකයා විසින් සේවයේ යොදවනු ලැබ සිටින කම්කරුවන්ගේ මුළු ගණන විසිපහකට අඩු වන අවස්ථාවක, ඒ කම්කරුවාට,

ගෙවිය යුතු නොවන්නේ ය.

6. 4 වන නියෝගයේ විධිවිධාන යටතේ සේවායෝජකයකු විසින් කම්කරුවකුට ගෙවිය යුතු දීමනාව 1975 පෙබරවාරි මාසය වෙනුවෙන් ද ඒ විධිවිධානවලට අනුකූලව ගෙවිය යුතු අතර, 7 වන නියෝගයේ විධිවිධාන එසේ ඇත ද, 1975 පෙබරවාරි මාසය වෙනුවෙන් වූ දීමනාව 1975 මාර්තු මස 20 වන දින හෝ ඊට පෙර සේවායෝජකයා විසින් ගෙවිය යුතු ය.

7. යම්කිසි කර්මාන්තයක නියුක්ත යම්කිසි කම්කරුවකුට මේ නියෝග යටතේ ගෙවිය යුතු මුදල යම් ලිඛිත නීතියක කාර්යයන් සඳහා ඔහුගේ වේතනයෙන් කොටසක් සමන්විතවේ යයි සැලකිය යුතු අතර ඒ අනුව ඒ කම්කරුවාගේ වේතන ගෙවීමට සේවායෝජකයා බැඳී සිටින කාලසීමාව තුළ ඔහු විසින් ඒ මුදල ගෙවිය යුතු ය.

8. 1975 මාර්තු මස 1 වන දිනට පෙරාතුවම යම් සේවායෝජකයකු විසින් යම් කර්මාන්තයක සේවයෙහි නියුක්ත කර ගනු ලැබ සිටි සෑම කම්කරුවකුම, ඒ සේවායෝජකයාගේ කම්කරුවකු වශයෙන් ඔහු නොකඩවා සේවය කරන තාක් කල්, 1975 මාර්තු මස 1 වන දිනට පෙරාතුවම වූ දිනයෙහි ඔහු භුක්ති විඳිමින් සිටි, වැටුප්, දීමනා හෝ කවර නාමයකින් හෝ අභිධානයකින් වුවද හඳුන්වනු ලබන මුදලෙන් කරන ලද වෙනත් ගෙවීම්වලට අදාළ නියම හා කොන්දේසිවලට නොඅඩු වාසි සහගත තත්ත්වයෙන් යුත් නියම හා කොන්දේසි පිට ඒ සේවායෝජකයා විසින් එසේ නොකඩවා සේවයෙහි යොදවනු ලැබිය යුතු අතර මෙම නියෝග යටතේ ගෙවිය යුතු දීමනාව ඒ වැටුප, දීමනාව හෝ වෙනත් ගෙවීම්වලට අතිරේකව විය යුතු ය.

9. 4 වන හෝ 6 වන නියෝගය යටතේ කම්කරුවකුට ගෙවනු ලැබීමට නියමිත මුදල් කිසිවක් ගෙවීම යම් සේවායෝජකයකු විසින් පැහැර හරිනු ලැබීම හේතුකොටගෙන අධිකරණයක් විසින් ඒ සේවායෝජකයා වරදකට වරදකරු කරනු ලැබූ විට, අධිකරණය විසින් ඒ වරද සඳහා නියම කරනු ලැබිය හැකි වෙන යම් දඬුවමකට අතිරේකව, ආඥාවෙහි නිශ්චිතව සඳහන් කාලයක් ඇතුළත ඒ මුදල ඒ කම්කරුවාට ගෙවන ලෙස එම අධිකරණය විසින් ඒ සේවායෝජකයාට අණ කළ හැකි අතර ඒ මුදල එසේ නොගෙවනු ලැබුවහොත් එය අධිකරණය විසින් නියම කරනු ලැබූ දඩයක් මෙන් අධිකරණයෙහි අණ පිට අයකර ගත හැකි ය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම නියෝගවල—

'' කොමසාරිස් '', '' සේවායෝජකයා '' සහ '' වේතන '' යන යෙදුම්වල (136 වන අධිකාරය වූ) පඩිපාලක සභා ආඥාපනතෙහි දී ඇති අර්ථම පිළිවෙලින් විය යුතු ය ;

'' සාමූහික ගිවිසුම '' යන්නට කාර්මික ආරාවුල් පනතෙහි දී ඇති අර්ථයම විය යුතු ය ;

'' ඉපයීම් '' යන්නට 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි දී ඇති අර්ථයම විය යුතු ය ;

'' කර්මාන්තය '' යන්නට සේවායෝජකයකු විසින් හෝ කම්කරුවකු විසින් හෝ පවත්වා ගෙන යනු ලබන, ඉටු කරනු ලබන හෝ ක්‍රියාවේ යොදවනු ලබන යම් කර්මාන්තයක්, වෙළෙඳ ව්‍යාපාරයක්, ව්‍යවසායක්, රක්ෂාවක්, වෘත්තියක් හෝ ජීවනෝපායක් සහ යම් කර්මාන්තයක යම් අංශයක් හෝ එබන්දක යම් කාර්යයක් හෝ යම් කාර්ය පද්ධතියක් ඇතුළත්වන නමුත් සේවා යෝජකයකුගේ තත්ත්වයෙන් ආණ්ඩුව විසින් මුළුමනින්ම ප්‍රාග්ධනය ප්‍රතිපාදනය කරනු ලැබූ සංස්ථාගත හෝ සංස්ථාගත නොවූ මණ්ඩලයක් හෝ බාලාපරාධකරුවන්ට හෝ අනාථ දරුවනට හෝ අසරණ, ගොළු, බිහිරි හෝ අන්ධ තැනැත්තන්හට කාර්මික පුහුණුවක් දීමේ කාර්යය සඳහා මුඛ්‍ය වශයෙන් පවත්වාගෙන යනු ලබන යම් කාර්මික ව්‍යාපාරයක් හෝ ව්‍යවසායක් ඇතුළත් නොවේ ;

'' කම්කරුවා '' යන්නෙන් යම් කර්මාන්තයක, කාර්මික ව්‍යාපාරයක, වෙළෙඳ ව්‍යාපාරයක, රක්ෂාවක හෝ ජීවනෝපායක යම් වැඩක් කිරීම පිණිස වාචික, ලිඛිත, ප්‍රකාශිත හෝ ගම්‍යමාන ගිවිසුමක් යටතේ සේවායෝජකයකු විසින් සේවයෙහි යොදවනු ලබන තැනැත්තකු අදහස් වන අතර ලිඛිත නීතියකින් හෝ වෙනත් ක්‍රමයකින් ස්වකීය වැටුප හෝ වේතන විධිමත් කරනු ලැබ ඇති කම්කරුවෙක් සහ කෑලි ප්‍රමාණයේ වැඩක සේවයේ යොදවනු ලැබ ඇති කම්කරුවෙක් ද ඊට ඇතුළත් වෙති. එහෙත් ගෘහ සේවකයකු හෝ සේවායෝජකයකුගේ පෞද්ගලික රියැදුරුකු එයට ඇතුළත් නොවේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී